# බළන්ගොඩ නගර සභාව

## බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමට සුදුසු බදු කරුවෙක් තෝරා ගැනීම සඳහා ලංසු අයදුම්පත් කැඳවීම.

2017 අප්‍රේල් මස 20 වන දින සිට 2017 දෙසැම්බර් මස 31 වන දින දක්වා පහත උපලේඛනයේ විස්තර කරනු ලබන බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමේ සේවය සැපයීම වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් එස්.එච්.ජී. කරුණාරත්න වන මා විසින් 2017 අප්‍රේල් 20 වන දින පෙ. ව. 10.00 දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර සතියේ වැඩ කරන දිනයන්හි වැඩ කරන වේලාව තුල දී කාර්යාලයීය දුරකථන අංක 045 - 22 872 75 ඇමතිමෙන් හෝ urbanbg@ sltnet.lk වෙතින් ලබාගත හැකි ය.

**ලංසු අයදුම්පත් නිකුත් කිරිම:**

2017 අප්‍රේල් මස 17 වන දින ප.ව. 3.00 දක්වා නියමිත ගාස්තු අයකර බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ලංසු අයදුම්පත් භාර ගැනීම:**

2017 අප්‍රේල් මස 20 වන දින පෙ.ව.10.00 දක්වා ලංසු අයදුම්පත් භාර ගනු ලැබේ. ලංසු අයදුම් කරුවන් විසින් සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් හෝ **"ලේකම් බළන්ගොඩ නගර සභාව"** යන ලිපිනයට 2017 අප්‍රේල් මස 20 වන දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ යොමුකළ හැකි ය. නියමිත වේලාවට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලංසු අයදුම්පත් විවෘත කිරිම:**

2017 අප්‍රේල් මස 20 වන දින පෙ.ව. 10.30 ට බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ලංසු අයදුම්පත් විවෘත කරනු ලැබේ. මෙම අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ ලිඛිතව බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකි ය.

### ඉහත කී උපලේඛනය

| අනු අංකය | ලංසු අයදුම්පත් කැඳවනු ලබන සේවාවේ ස්වභාවය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසු අයදුම්පත් ගාස්තු | | |
|---|---|---|---|---|---|
| | | | ගාස්තුව | වැට් | එකතුව |
| 01 | 2017 වර්ෂය තුල අනුමත වැඩසැළස්ම අනුව නගරයේ වීදි ඇමදීම හා එකතු කරනු ලබන කසළ, නිවාස වලින් හා වාණිජ ස්ථාන වලින් ඉවත්කරනු ලබන කසළ, බැංකියවත්ත දක්වා ප්‍රවාහණය, පොළ පවිත්‍ර කිරීම හා කසළ එකතු කිරීම, බස්නැවතුම්පළ දිනකට දෙවරක් පවිත්‍ර කිරිම හා කසළ ඉවත් කිරීම, කාපට් මාර්ග වල වැලි ඉවත් කිරීම. (නගර සභාවෙන් සපයන ලද වාහන හා රියදුරන් යොදා ගෙන) | රු. 5,000.00 | රු. 1,000.00 | රු. 150.00 | රු. 1,150.00 |

**විශේෂ කොන්දේසි:**

- ✓ ලංසු අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමේ ලංසු කැඳවීම ලෙස සඳහන්කළ යුතු ය.
- ✓ ලංසු අයදුම්කරු ආරක්ෂණ ඇප තැන්පතුවක් වශයෙන් රුපියල් විසි දහස(20,000.00)ක මුදලක් සභාවේ තැන්පත්කළ යුතු ය.
- ✓ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරිමේ අයිතිය බළන්ගොඩ නගර සභාව සතු ය.

2017 මාර්තු මස 29 වන දින,
බළන්ගෙඩ නගර සභාවේදී ය.

එස්.එච්.ජී. කරුණාරත්න,
ලේකම්,
බළන්ගොඩ නගර සභාව.